# පහන් වැට

**2006 සන්නස සාහිත්‍ය තරගයේ මුල් තැන දිනූ කවිය**

## මහළු පියාගේ ඔස්ට්‍රේලියානු සංචාරය

### සුභාෂිනි හේරත්

අනේ කොතරම් හොඳද? තාත්තා ආපු එක.
හය මසක කාලයක් අපිත් එක්කල ඉන්න.
තමන්ගේ පාඩුවේ ජීවිතේ ගෙන යන්න
මේ වගේ රටක් තව ලොවේ වෙන කොහෙ ඇද්ද?

වැසිකිලිය, වතුරමල හැමදේම ගේ ඇතුලේ
සතිඅන්තෙ ෂොපින් ගොස් ෆ්‍රිජ් කබඩ් පිරෙව්වම
දොර ජනෙල් වහගෙනම ඉන්න හැකි ගේ ඇතුළේ
තාත්තටම තේරේවි ටික දිනක් යන විටදී,
මොනතරම් පහසුදැයි මේ රටේ දිවි ගෙවුම

ෆ්‍රිජ් එකේ තියෙන දේ මයික්‍රොවේවයෙ දමා,
කිරන උණුසුමක් දී රත් කරල ගත්තාම,
දැන් ඉව්ව වගේමනේ සුවඳ උණුසුම එහෙම,
තාත්තත් කැමතියිනෙ රස්නෙ පිට බත් කන්න.

හෙට උදේ ඉඳලාම ආයෙමත් අපිට වැඩ,
දැනුනොතින් පාළුවක් අපි නොමැති ඇසිල්ලේ,
මෙන්න ටෙලිවිෂන් එක දමාගෙන ඉන්නෝනැ,
මේ තියෙන පත්තරත් කියවන්න ඇහැකි නොවැ
තාත්තට නිදහසේ ඉඳගෙනම රිසි ලෙසින
කුඹුරු පිටි වැඩ කරල තාත්තල දුර්වලයි
ඔන්න මේ හය මාසෙ ඉන්නෝනෑ 'රෙස්ට් එකේ''

මේ දවස්වල මෙහෙට බොහෝමත් රස්නෙයිනෙ
දමාගෙන ඉන්නකෝ මේ විසල ''කූලරය''
එළිවෙන්න පාන්දර දැනුනොතින් සීතලත්,
මේ තියෙන හීටරය සදයි නිසි උණුසුමක්
තාත්තා ලෙඩ උනොත් පලක් නැහැ සංචාරෙ
බෑනගෙන් මාමාට තවත් උපදෙස් වගෙයි
කොයි දේත් කියන්නේ තාත්තගෙ හොඳටමනේ

තාත්තා පැමිණිලා මාසයක් ගෙවුන සඳ,
හදිසියේ කන වැකුණි, දුරකතන සංවාදෙ,
''මොනවදෑ මගෙ මැණිකේ, මේ තොරතුරු ඉතිං
''අදට මාසයක් නොවැ මේ සුපිරි හිර ගෙදර''
''අපොයි තව පස් මසක් තියෙනවා නොවෙද මට'
''ඇඟ බැදපු ජීවිතේ සුපිරි ලෙස ගෙවන්නට?''

## තනි මල

### චන්ද්‍රිකා ද සිල්වා

පරත්

අතින් අතට
මාරුවෙමින් ගිය
මල් වට්ටි දහසකින්
වෙහෙර ගේ ගොඩ ගැසෙයි.

හෙට උදේ නුඹ අවුත්
පිසදමා මල් අස්න
හලයි පර මල් ඉවත
අළුත් මල් තබන්නට.

මල් පුදන්නට
සුවඳ මල් නෙළු
නටු හිස්ව ඇති ගසෙහි
ඉතිරිවුන එකම මල
රේණු සුළඟට සලා
බලන්නේ කර පොවා
වෙන මලක් ඇති කියා
ලගපාත.
අනේ තනිවුනු මලේ
නුඹේ වතගොත සොයා
ලියන්නට
බිගු නොඑන මැදියමේ
පරවුනොත් අද රෑට
හෙට උදේ නුඹ වගේ
තවත් මල් පිජේවිද
නුඹයි අවසන් කැකුළ.

## සිරි දළදා වරුණ

### ශ්‍රියා කුමාරසිංහ

පැරකුම් ගාමිණී මහසෙන් දෙව්වරු
දිවි දී සුරකිනවා
දෙදහස් පන්සිය වසරක උරුමය
නොමැකී පවතිනවා

සවන පුරා ගුවන පුරා
අකුණු හඬින් කස පුපුරනවා
ඩෙංකුටු ඩෙංකුටු ගැට බෙර තාලෙන්
රැඟුම් ගලා යනවා

අවු අතු මුර අතු චාමර සේසත්
සුළඟේ ලෙළ දෙනවා
ගිණි කෙළි පන්දම් රන්වන් පාටින්
මාවත සරසනවා

ඇතුන් අරා බරණ දරා
රජවරු පෙර ගමනේ යනවා
සිංහල සළකුණ දළදා මහිමෙන්
බැති සිත් සැනසෙනවා

මංගල ඇතු පිට සම්බුදුන් වැඩ හිඳ
බුහුමන් ඉවසනවා
වැව් දිය මත සඳ ආසිරි පතමින්
තරු මල් වපුරනවා

රැස් පතුරා පින් උතුරා
කඳුරට සිරියෙන් බැබලෙනවා
සෙංකඩගල පුර දළදා සිරිතෙන්
හෙළයම පිබිදෙනවා

## සාගර වෙරළේ.......

### පද්මසිරි හේරත්

වෙරිබි වික්ටෝරියා

සාගර වෙරළේ වැලි මාලිග සදනා
පොල් රුප්පාවේ දූව පනිමින් නටනා
මුදුකරේ අතුපැළ සුළඟට වැනෙනා
අයිය නගාලට වේදෝ සුව සයනා

තනිකර නුඹලා අම්මා කොතැන ගියේ
ඉසුරු ගෙනෙන්නට සයුරින් එතෙර ගියේ
ඇත නැගෙන කලු දළ රළ හඬට බියේ
බාල බොළඳ සිත තනි වී අඳුරු රැයේ

අතට වෙරළු ඇහිදින්නට ගසක් නැතී
ඉනට පලා නෙලනට හිම් බිමක් නැතී
පැතුම සිතේ නුඹලා ගැන ඉමක් නැතී
කතර තනිව මව කඳුළැලි සලනු ඇතී

සිඳු නිසසල වී ගීයක් මුමුනාවී
කර දිය වුව මුදු සුවඳක් විහිදාවී
නව අරුනළු දී හෙට හිරු පායාවී
නිදියන් පුත ළඟදී අම්මා එවී

**2006 සන්නස සාහිත්‍ය තරගයේ තෙවන තැන දිනූ කවිය**

## තිලිණය

### රුක්මලී දසනායක

පෙබරවාරි මාසය මැද
වැලන්ටයින් දිනය වේය
සිඩ්නි නුවර සල්පිල් වල
රෝස කැකුලු පිපී ඒය

අතමිට සරු මහත්වරුන්
කාසි අහුරු විසි කරාවි
රෝස පොකුරු අර ගනීවි

අයි ලව් යූ අකුරු ලියපු
බැලුම් බෝල හදවත්වල
රතු පීත්ත දවටා
රෝස පොකුරු අර ගන්නේ

ආදරයේ මහිම මේය
පෙම්වතියට පවසන්නය
ප්‍රේමය නොසිඳුනු බව තව
බිරින්දෑට අඟවන්නය

රෑ බෝවී වැඩ නිමවී
එනකල මා කැටුව යන්න
දුම්රිය පොල රිය නවතා
බලාහිඳී මා හිමි සඳ

නුඹට විඩා වැඩි නොවැ අද
තවත් වෙහෙස නොවනුව ඔබ
බතක් මාලුවක් යන්තම්
උයා දෙන්න හැකිනොවැ මට

ඔබේ සෙනෙහෙ එම වදනින්
මල් දහසක් පිජේ මසිත
සැහැල්ලුවට පාවී යයි
පුලුන් රොදක් වෙලා මසිත

**2006 සන්නස සාහිත්‍ය තරගයේ දෙවන තැන දිනූ කවිය**

## තාත්තාට

### තුසිත් අබේනායක

පෑල දිග අඩ අඳුරු අහස'ග
හිරුත් මහලුව සෙමින් සැඟවෙන
සැදෑවට සැන්දෑ සමය ගැන
දුක හිතෙනවා ඇති තාත්තට

හිසත් සුදු වන තුරුත් හිස මත
තබා ගෙන දුක නේක පිරිපත
හැදූ මහගෙය පාලු වූ සඳ
දුවා දරුවන් ඉගිල්ලී ගිය
හිස් අහස දෙස නෙතු යොමනවද.....

සැපක් නොවිඳ හැම සැම දරුවන්ට දිදී
උන්ගේ සිත ළඟ තම දුක නිවු නිතී
අයෝබලව මහලුව අද හිනා වෙවී
පුතුන් පියාපත් ගැන සිහි කරනු ඇතී

රැයේ සිසිරයේ සීතේ නිදන කොට
මගේ උණුහුමට ගුලි වන පැටව් ගැන
අදට මට දැනෙන හිත පාරවන දුක
අනේ නුඹට අදටත් තව දැනෙනවද

තලා නියෙන් වත් පාරක් නොගසාම
පුරා උරස අප නිදි කළ හැමදාම
දමා ආ නමුත් තොරටට පෙර දාක
පැසුණු කරළ මට නුඹ මය මපියාණ

ගුවන් තොටුපොලේ වැට ළඟ
දෙඅත් උස්සා අහසට
හිනා වී සමු දුන් හැටි
තාම මතකයි තාත්තේ මට

එදා නුඹ කොපුලස තෙමී වට
කඳුළ මුළු විශ්වයයි අද මට
පියාඹා විත් සයුරු දුර බිඳ
හිස තබන්නට හිතයි පාමුළ

## හෘද වාට්ටුවේ නේවාසික මහළු රෝගියාගේ කවිය

### හැරිස් පරකන්දෙණිය

සතර පෙර නිමිත්තෙන් හරි අඩක්
ලෝහමය සයනයේ වැතිරිලා
ශ්වේතවත් පොරෝණය ඇතුලතේ ගුලිවෙලා
විශ්‍රාම දෙනෙත් යුග
බිත්ති ඔරලෝසුවේ හිරවෙලා
අමුත්තන් පැමිණෙනා හෝරාව එනතුරා
ගිලන් වූ හද කොණක
කොලොස්ටරෝල් පැතුම් පොදි පිබිදිලා

හද අඬන රිද්මයේ රටාවන්
රුධිර පීඩන උෂ්ණත්වයන්
මනින උපකරණ කැල සතුරු ලෙස සිනාසෙති
නව අනූවක් රෝග
සුවහසක් ව්‍යාධීන් සුවකරන ඔසු දියර
හිසට ඉහලින් ඇමිණි නාලයේ ගලාවිත්
ග්‍රීවයේ ශිරා නාලිකාවට
බිඳෙන් බිඳ ඇතුල් වෙති
ගත වෙහෙස මැද නිරායාසයෙන්
නෙත් කෙවෙනි බරව පියවෙනා තුරු
නෙක වර්ණ උන්මාද බලි රූප කල් බලති
ඔරලෝසු දිගු දෑත හුස්ම හිර කරද්දී
නෑසියෙක් හිතවතෙක් දකින්නට කළ පැතුම්
ටිකෙන් ටික දුරස් වෙති

සති තුනක් මැෂින් ගත දුබල ගත
මේ සිපිරි කුඩුවෙන් මිදෙන බල
කොයි දිනෙක ලබන්නද?
බිත්ති හතරෙන් එහා ලෝකයට
යලිත් කොයි දිනේ පා නගන්නද?
කොයි දිනෙක සුමුදු සඳු තරු පොකුරු
හිරු නගින බසිනයුරු දකින්නද?
කොයි දිනෙක ගෙයි පිසුන බත් පතක
පොලොස් ඇඹුලක සුවඳ විඳින්නද?

## මේ මල් උයනේ මල් වාරයයි. .

### ප්‍රකාශ් වැල්හේන

උනුසුම දැනේ ළඟ ළඟ එන    වසන්තයේ
හැම හැම මුවග තුටු හසරැලි    නැගී තියේ
නිසි සම ගුණය ලැබ තුරුලිය    පිනා ගියේ
සිත්තම අඳිමි වරුණය    ෆ්ලෝරියාඩයේ

නුබ කුස සිසාරා සියොතුන්    පියඹන්නේ
හිම්දිරි පාන්දර කිච් බිච් නද    දෙන්නේ
සැණකෙලි සමය ගැන තුඩ තුඩ    රැව් දෙන්නේ
අග නගරයේ මල් සුවඳයි    විහිදෙන්නේ

නුදුරින් පවුරු බැඳි කඳු පෙළ    මහ බෙදුම
කොසියස්කෝ උයන සිසිලස    දෙයි තවම
පසෙකින් බ්‍රින්ඩබෙල්ලා පියසයි    කදිම
මේ නිම්නයේ වග වෙන කුමකට    උවම

පිස    ගෙන  සිසිල වැව් ඉවුරෙ    ගිනින්දරා
රැව්    දෙන ගුමු නඳින් සැම දෙස    සවන් පුරා
ජන    මන  ඉපිල යන සුවඳින්    සැවැන්දරා
මේ මල් උයන  පිහිටයි මැද මෙ    කැන්බරා

නගරය මැද ඉඳන්    පාරලිමෙන්තුවට
යනවිට පෙනේ දුර සිට පැහැ ගත්    රුවට
අහසට විදින දිය කඳ ළඟ වම්    පසට
බර්ලි ග්‍රිෆින් වැව් ඉවුරට ගෙඩ    වෙන්ට

නෙක පැහැ රටා ඇතිරූ ලෙස    බුමුතුරුණු
බැලූ බැලූ හැම අතේ මුදු සුවඳින්    පිරුණු
විස්කම් මවන දස්කම් හැම මුසු    කෙරුණු
මිහි පිට දේව උයනෙකි අහසින්    වැටුණු

ගොඩ වුණු තැනම පිබිදුන ටියුලිප්    පේලී
සැරසී සිටී පිළිගන්නට පෙළ    පාලී
හිනැහෙන මද පවන් වැද මේ    මනමාලී
තරු මල් රටා වෙන් නංවයි ජය    කේලී

කහ රතු සුදු රෝස දම් කොල හා    නීල
එකිනෙක පරයමින් ගෙන එයි නෙත    සීල
පැහැ සංයෝජනය සුමටයි ලෙස    දූල
සුරගන මිස කව්රු මවනුද මේ    ලීල

දේදුන්නෙන් උරා ගෙන මල් පැහැ    ගැනුනේ
මුසු කොට මද නලට මුදු සුවඳයි    දැනුනේ
බිඟු නද ගීතයකි මන පිනවන    සිහිනේ
මේ ෆ්ලෝරියාඩ් මල් වාරය මල්    උයනේ